කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2022 මාර්තු මස 02 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 මාර්තු මස 02 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**නිරිත දිග බෙංගාල බොක්ක සහ ඊට යාබද ගිනිකොණ දිග බෙංගාල බොක්ක ආශ්‍රිත පවතින අඩු පීඩන කලාපය තවදුරටත් ස්ථානගතව පවතින අතර එම පද්ධතිය තවදුරටත් වර්ධනය වෙමින් බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි දින කිහිපයේදී ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

මෙහි බලපෑම හේතුවෙන් අද දින (02) රාත්‍රියේ සිට 04 දින දක්වා උතුරු, උතුරු-මැද, නැගෙනහිර සහ ඌව පළාත්වලත් මාතලේ දිස්ත්‍රික්කයේත් වැසි තත්ත්වයේ වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත්වල අහස වලාකුළින් බරව පවතී.

නැගෙනහිර සහ ඌව පළාත්වලත් මාතලේ, නුවරඑළිය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇති වන අතර ඇතැම් ස්ථාන වලට **මි.මී. 75** ට වැඩි තරමක තද වැසි ද ඇතිවිය හැක.

උතුරු පළාතේත් මහනුවර, හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලත් වැසි වාර කිහිපයක් ඇතිවේ.

සබරගමුව පළාතේත් ගාල්ල, මාතර සහ කළුතර දිස්ත්‍රික්කවල සවස් කාලයේදී හෝ රාත්‍රි කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

උතුරු, උතුරු-මැද, නැගෙනහිර, වයඹ සහ ඌව පළාත්වලත් මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවලත් හම්බන්තොට දිස්ත්‍රික්කයෙත් සුළගේ වේගය විටින් විට **පැ.කි.මී (40-50)** දක්වා වැඩි විය හැක.

**WEATHER FORECAST FOR 02 MARCH 2022**
**Issued at 05.30 a.m. on 02 MARCH 2022**

**The low pressure area still persist in the South-west Bay of Bengal and the adjoining South-east Bay of Bengal. It is likely to intensify further and move west-northwestward towards the east coast of Sri Lanka during the next few days.**

Under the influence of the aforementioned low pressure area, Showery condition in Northern, North-central, Eastern and Uva provinces and in Matale district is expected to enhance from tonight (02) to 04$^{th}$ March.

Cloudy skies can be expected in the Eastern, Uva and Central provinces.

Showers will occur at times in Eastern and Uva provinces and in Matale, Nuwara-Eliya and Polonnaruwa districts. Fairly heavy showers above **75 mm** can be expected at some places in the above areas.

Several spells of showers will occur in Northern province and in Kandy, Hambantota and Anuradhapura districts.

Showers or thundershowers will occur at a few places in Sabaragamuwa province and in Galle, Matara and Kaluthara districts during the evening or night.

Wind speed can increase up to **(40-50) kmph** at times in Northern, North-Central, Eastern, North-Western and Uva provinces, Eastern slopes of the central hills and in Hambantota district.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100,
Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100,
තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2022 මාර්තු මස 02 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

නිරිත දිග බෙංගාල බොක්ක සහ ඊට යාබද ගිනිකොණ දිග බෙංගාල බොක්ක ආශ්‍රිත පවතින අඩු පීඩන කලාපය තවදුරටත් ස්ථානගතව පවතින අතර එම පද්ධතිය තවදුරටත් වර්ධනය වෙමින් බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි දින කිහිපයේදී ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. නැවත දැනුම් දෙන තුරු, මෙම මුහුදු ප්‍රදේශය තුල **(01N-11N, 83E-93E)** ධීවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.

ඉදිරි දින කිහිපයේදී ශ්‍රී ලංකාවට ගිනිකොණ, නැගෙනහිර සහ ඊසාන දෙසින් වන මුහුදු ප්‍රදේශ වල ධීවර සහ නාවික කටයුතු වල යෙදීමේදී අවධානයෙන් කටයුතු කරන ලෙසත්, ඉදිරි කාලගුණ අනාවැකි පිළිබඳ ව අවධානයෙන් පසු වන ලෙසත් ධීවර හා නාවික ප්‍රජාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**වැසි තත්ත්වය:**

ත්‍රිකුණාමලය සිට මඩකලපුව සහ පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමා එයි. සුළඟේ වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම සහ පුත්තලම හරහා කොළඹ දක්වා සහ ත්‍රිකුණාමලය සිට මඩකලපුව සහ හම්බන්තොට හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (45-55)** පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට මන්නාරම සහ පුත්තලම හරහා කොළඹ දක්වා සහ ත්‍රිකුණාමලය සිට මඩකලපුව සහ හම්බන්තොට හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු වේ.

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 05.30 a.m. on 02 MARCH 2022**

The low pressure area still persist in the South-west Bay of Bengal and the adjoining South-east Bay of Bengal. It is likely to intensify further and move west-northwestward towards the east coast of Sri Lanka during the next few days. Naval and fishing communities are advised not to venture into these sea areas (**01N-11N, 83E-93E**), until further notice.

Further, the fishing and naval community in the sea areas to the South-east, East and North-east of the Sri Lanka, are advised to be vigilant in this regards and requested to be attentive in future weather forecasts.

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Trincomalee to Hambantota via Batticaloa and Pottuvil.

**Winds:**

Winds will be north-easterly and speed will be (**30-40**) **kmph**. The wind speed can increase up to **(45-55) kmph** at times over the sea areas off the coast extending from Kankasanturai to Colombo via Mannar and Puttalam and the sea areas off the coast extending from Trincomalee to Matara via Batticaloa and Hambantota.

**State of Sea:**

The sea areas off the coast extending from Kankasanturai to Colombo via Mannar and Puttalam and the sea areas off the coast extending from Trincomalee to Matara via Batticaloa and Hambantota will be rough at times. The other sea areas around the island will be moderate.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි